| අවුන්ස් | 16 = | රාත්තල් | 1 |
| රාත්තල් | 28 = | ක්වාටර් | 1 |
| ක්වාටර් | 4 = | හොණ්ඩර | 1 |
| හොණ්ඩර | 20 = | ටොන් | 1 |

සැලකියයුත්තක්.—ග්‍රේන්ස් 180ක් එවොයිර්ඩුපොයි ඩ්‍රෑම්ස් 6·582—එනම් ඩ්‍රෑම්ස් 7[illegible] ඇබුයි.

[Tender for License to sell Opium by Retail within the Local Board limits of Matara.]

වර්ෂ 1899වෙනි අවුරුද්ද පටන් 1905 දක්වා අබිං සම්බන්ධ ආඥාපනත්වල ප්‍රකාර මාතර නගරිකයේ ප්‍රධානතැන විසින් මෙහි පහත සඳහන්වන ප්‍රකාරයට ප්‍රධානතැන විසින් ඒත්තුගන්ට යෙදෙන කඩවීදියේ සහ කොටුවේ ගොඩ ස්ථාන දෙකක මාතර නගරිකයේ මායිම් තුළ අබිං බෙදා විකිණීමේ බලය ඉල්ලාදෙන වෙන වෙනම මුද්‍රා කරනලද අලුත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1909යේ නොවැම්බර් මස 22වෙනි සඳුදින පස්වරු 1 පැය වනතුරු මාතර කච්චේරියේදී බාරගන්ට යෙදෙන බව මෙයින් දන්වමි.

2. ඉල්ලුම්කරණ පිළිවෙළ :—

(a) වර්ෂ 1910යේ අවුරුද්දේ පළමුවෙනි හමාසයටද.

(b) වර්ෂ 1910යේ අවුරුද්දේ ඊළඟ හමාසයටද.

(c) වර්ෂ 1911යේ අවුරුද්දේ පළමුවෙනි හමාසයටද යනුයි.

3. බද්ද විකුණනු ලබන්නේ හය මාසයකට පමණක්ය. ඊටපසු වැඩිපුර හය මාසයකට හෝ දොළොස් මාසයකට හෝ අලුත්වැඩියාකිරීම ආණ්ඩුවේ කැමැත්තේ ප්‍රකාරයට වේ.

4. ටැන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර දෙන අය තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන්ට ලියවිල්ලකින් බලයලත් ඔහුගේ කළමනාකාරයෙක් වර්ෂ 1909යේ නොවැම්බර් මස 22වෙනි දින පස්වරු 1ට මාතර කච්චේරියට ඇවිත් පෙණී නොසිටියොත් ඔහුගේ ඉල්ලුම්පත්‍රය සලකනු නොලැබේ.

5. ඉල්ලුම්පත්‍ර සෑහෙන අන්දමට නොතිබුණේවිනම් මාතර නාගරික සභාවේ ප්‍රධානතැන විසින් බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙනවා ඇත.

වර්ෂ 1909ක්වූ ඔක්තෝබර් මස 30වෙනි
දින මාතර නාගරික කන්තෝරුවේදීය.

ඩබ්ලියු. ඇල්. කිස්බර්ස්ලී,
නාගරික සභාවේ ප්‍රධානතැන.

---

බෙදා විකිණීමට ලයිසන්ස් (අවසරපත්‍ර) දීමේ කොන්දේසි.

අබිං විකිණීමට මිලගෙවා ලයිසන්ස් (අවසර) ලබාගන්නා අය විසින් ඔහු ගැනුම්කාරයා බව එහි නිසි බලයලත් මූලාදෑනිතැන විසින් කියාදුන් වහාම තමා ඉල්ලුම්කළ ගණනෙන් තුනෙන් පංගුවක් මුදලෙන් ගෙවන්ට ඕනෑය. ඒ මුදල ඒ බලයලත් මූලාදෑනිතැන විසින් ඇපයක් වශයෙන් තිබාගන්ට යෙදෙනවා ඇත. ගැනුම් මුදලේ වරින්වර ගෙවන කොටස් වෙනුවට එය හිලව්කරන්ට නුසුදුසුවන. නුමුත් අන්තිම දෙමාසේට ගෙවන කොටස්වලට එය හිලව්කළ හැකිය. ගැනුම් මුදල මාසේකට හයෙන් පංගුව බැගින් තමාගේ බද්ද පවතින අතරතුර එක එක මාසේ අන්තිම දවසේදී ගෙවියයුතුයි. පළමුවෙනි වාරේ කොටස වර්ෂ 1910ක්වූ ජනවාරි මාසේ 31වෙනි දින ගෙවියයුතුයි. වාර ගෙවිල්ලක් ප්‍රමාදකරන එක එක දවසට අවුරුද්දට සියේට නවය ගණනේ වැටෙන පොලී ගෙවියයුතුයි. ඇප මුදල ගැනුම්කාරයාගේ ඉල්ලීම පිට ඔහු විසින් නියමකරන බැංකියක කිසවල මුදලක් කොට දැමිය හැකිය. එය නැතිවිනම් එහි අලාබය ඔහු විසින් දැරියයුතුයි. නියම දවසේදී යම් වාරමුදල් කොටසක් නොගෙවනලද්දේනම්, නිසි බලයලත් මූලාදෑනිතැන විසින් ඒ ලයිසන්ස් නොහොත් එයින් ගතනොවී තිබෙන කාලප්‍රමාණය එයින් වන පාඩුවට ලයිසන්ස්කාරයා යටත්කොට විකිණිය හැකිය.

2. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ස්ටෝරුව නොහොත් ඉඩම මේ ලයිසන්ස් පත්‍රය තුළ සම්පූර්ණයෙන් විස්තර කළ යුතුයි. මේ ලයිසන්ස් (අවසරය) එහි විස්තරකළ ඉඩමට මිස ඉන් මනත් කිසිවකට ඇතුළත් නොවේ.

3. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම වෙනයම් ගොඩනැගිල්ලක් නොහොත් ඉඩමක් සම්බන්ධව ඇතුළතින් යාම්ඊම්වලට අවකාශ ඇතුව තිබියයුතු නොවේ.

4. මෙයින් ලයිසන්ස් දෙනුලබන ගේදොර ශුද්ධපවිත්‍රවද සනීපලැබෙන අන්දමටද තබාගත යුතුයි.

5. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම පරීක්ෂාකරන්ට නිසි බලයත් මූලාදෑනිතැන විසින් ලියවිල්ලක් පිට පත්කරන කෙනෙකුට නොහොත් ඉන්ස්පැක්ටර් තනතුරකට පහත්නොවන යම් පොලිස් මූලාදෑනියෙකුට දොරවල් ඇරලා පෙන්වීම ඒ ගේදොර භාරව සිටින අයගේ යුතුකමක්ය. තවත් තමා ළඟ තිබෙන අබිං ගැනීම හෝ අලෙවි කිරීම සම්බන්ධ පොත්පත් ලියවිලි නොහොත් ගණන් ලේඛන පෙන්වීමටද, විශේෂයෙන් ඕනෑකළොත් පරීක්ෂාකරන වේලාවට තමා ළඟ නොහොත් ගේදොරෙහි තිබෙන සියලුම අබිං ඉන්ස්පැක්ටර්තැන හෝ පොලිස් මූලාදෑනියා ඉදිරිපිටදී කිරා පෙන්වීමට හෝ භාරේ සිටින අය බැඳිසිටින්නේය. ළඟ තිබෙන අබිං ප්‍රමාණයෙත්, පොත්වල හැටියට පරීක්ෂාකරන වේලාවට තිබියයුතු ප්‍රමාණයෙත් වෙනසක් දකින්ට තිබුනිනම් භාරකාරයා විසින් තමන්ට හැකිපමණින් ඊට කාරණ පෙන්විය යුතුයි.

6. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේදී අබිං කන්ට ඉඩදිය යුතුනොවේ.

7. මෙයින් ලයිසන්ස් දෙනලද ඉඩමෙහි තබා තිබෙන අබිං යම් විධියකින් අන් ද්‍රව්‍ය හා සමඟ මිශ්‍රකිරීමක් හෝ එහි ගතිය නරක්කිරීමක් හෝ නොකළ යුතුයි.

8. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි කෝලාහල ආදි නොනිසි හැසිරීම්වලට ඉඩනොදිය යුතුයි.

9. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේ මත්බීම නොහොත් අබිං පාවිච්චිකරලා මත්ව සිටින යම් අයෙකුට නොහොත් වයස අහළොහෙන් අවුලෙස පෙනෙන යමෙකුට අබිං දියයුතු නොවේ.

10. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමට රාත්‍රියේ අටටත් උදේ හයටත් අතරේ අබිං භාරගන්ට හෝ එයින් එය පිටකරන්ට හෝ යුතුනොවේ.

11. පිටු ගණන්කර ඉලක්කම් අමා බැඳපු ඔබු ගණන්ගන්නා පොතක් මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි තිබාගත යුතුයි. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමට මෙහි අන්දමේ පොතක් ලයිසන්ස්කාරයා තමාගේ ලයිසන්ස් පත්‍රය ගන්නාවිට නිසි බලයලත් මූලාදෑනිතැන විසින් නොමිලයේ දෙනුලැබේ. අලුත් පොතක් ඕනෑවිනම් ලයිසන්ස්කාරයා විසින් නිසි බලයලත් මූලාදෑනිතැනගෙන් මුදලට ගතයුතුයි. ඒ මූලාදෑනිතැනට පළමුවෙන් දීපු පොත භාරදිය යුතුයි.

12. ලැබුනාවූ සියලුම අබිංවල ගණන්ද, අලෙවිවූ ප්‍රමාණයද ඒ ගනුදෙනුවූ වහාම බඩු ගණන්ගන්න පොතේ පිළිවෙලින් සටහන්කිරීම ලයිසන්ස්කාරයාගේ යුතුකමක් වන්නේය. පොතේ සියලුම කවිටි හරිලෙස පිරවිය යුතුයි. තවත් ලඟ තිබෙන ප්‍රමාණය දවස පටන්ගැන්මේදීත් කෙළවරේදීත් පැහැදිලිලෙස පෙනෙන්ට තිබියයුතුයි.

13. එක එක මාසේ දෙවෙනි දින නොහොත් ඊට මත්තෙන් බඩු ගණන්ගන්නා පොතේ හරි පිටපතක්ද, නොම්මර 20 කොන්දේසියේ ප්‍රකාර තිබාගන්ට ඕනෑකරන පොතේ හරි පිටපතක්ද පොලිසියේ ඉන්ස්පැක්ටර් ජනරල් තුමා වෙත ඇරවීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

14. පොලිස් ඉන්ස්පැක්ටර් ජනරල්තුමාට ඒ හරි පිටපත් ලැබුනුවිට ඒ බවට කුවිතන්සියක් ඇරීම එතුමා ගේ යුතුකමකි. හරි පිටපතක් ඇරලා සතියක් ඇතුලත ලයිසන්ස්කාරයාහට එවැනි කුවිතන්සියක් නොලැබුණිනම් එකී පිටපත් ලැබුනාද නැද්ද කියා පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාගෙන් විභාගකිරීමද එය නොලැබී තිබුනානම් එකීන් පිටපත් ඇරීමද ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

15. තමාගේ ලයිසන්ස් පත්‍රය ලැබෙන්ට ප්‍රථමයෙන්, මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි වැඩට පත්කරන්ට අදහස්කර සිටින අයවලුන්ගේ නම් සටහන්වන ලැයිස්තුවක් නිසි බලයලත් මූලාදෑනිතැනට ඔප්පුකිරීම ලයිසන්ස්කාරයා ගේ යුතුකමකි. වැඩට පත්කරනලද එක එක අයගේ සම්පූර්ණ නම සහ විස්තරය මෙකී ලියවිල්ලෙහි අඩංගුවිය යුතුයි. තවත් ඒ එක එක අය විසින් කරන්ට යන වැඩේ ස්වභාවද සඳහන්කළ යුතුයි මේ අයවල් වයස අවුරුදු විසිඑකෙන් වැඩිවූවෝ වියයුතුයි. ඔවුන් හොඳ කල්ක්‍රියාවේ අයවල් බව නිසි බලයලත් මූලාදෑනිතැනට ඒත්තුවීයාම ඕනෑකෙරේ. මේ ලයිසන්ස් පත්‍රයෙහි නිසි බලයලත් මූලාදෑනියා විසින් නම ඒත්තුනොගත් කිසිකෙනෙකුන් ලයිසන්ස්කාරයා වෙනුවට අබිං භාරව සිටින්ට හෝ අබිං භාරගන්ට හෝ විකුණන්ට හෝ පත්කරගත යුතුනොවේ. නම ඒත්තුනොගත් කිසිකෙනෙකුට යටකී කිසි කටයුත්තක් කරන්ට ලයිසන්ස්කාරයා විසින් ඉඩදිය යුතුනොවේ.

16. වැඩට පත්වසිටින අයවලුන්ගේ ලැයිස්තුව අමුතුකරන්ට උවමනාවූ කල්හි ඒ ගැන නිසි බලයලත් මූලාදෑනිතැනගෙන් කලින්කල ඉල්ලුම්කළයුතුයි. ඒ කරන වෙනසක් ඇත්නම් මේ ලයිසන්ස් පත්‍රයෙහි ඒ ඒත්තුගත් බවට සටහන්කළ යුතුයි. තවත් මෙයින් ලයිසන්ස්ලැබූ ඉඩමක වැඩට පත්වසිටින යම් අයෙකු අහක්කරන්ට කියා බලයලත් මූලාදෑනිතැනගෙන් දැන්වීමක් ලැබුනවිට එය ලැබී සතියක් ඇතුලත ඒ වැඩකාරයාගේ නම ලැයිස්තුවෙන් අහක්කරන පිණිස මේ ලයිසන්ස් කඩදාසිය නිසි බලයලත් මූලාදෑනිතැනවෙත ඔප්පුකළ යුතුයි. ඉන්පසු ඒ අය මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි වැඩට අයොග්‍යවන්නේය.

17. මේ ලයිසන්ස් කඩදාසියේ නොම්මරයද, ලයිසන්ස්කාරයාගේ නමද, "අබිං බෙදා විකිණීමට ලයිසන්ස් ලදී" යන වචනද ලෑල්ලක පහසුවෙන් කියවන්ට හැකිලෙස ලියා මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේ ප්‍රකාශ ස්ථානයක පිහිටුවා තිබ්බවීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

18. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම අබිං සහ සුරුට්ටු විකිණීම පිණිස මිස වෙන වැඩකට හෝ කාරණයකට ගතයුතු නොවේ.

19. අත්පිට ගෙවන මුදලට මිස අබිං විකිණිය යුතුනොවේ.

20. ඩ්‍රෑම්ස් 4කට වැඩි බර ඇති අබිං කොටසක් විකුණනලද කල්හි මිලටගත් අයගේ සම්පූර්ණ නම හමද විකුණපු ප්‍රමාණයද, විකුණපු දිනද බඩුගණන් පොතේ වැඩිමනත් කාරණ සටහන්කරන්ට තිබෙන කවිටියෙහි සඳහන්කිරීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

21. හරි තරාදියක්ද, මෙහි පහත දක්වන ප්‍රමාණ පඩිද මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි නිතරම පාවිච්චියට ගැණීම පිණිස ලයිසන්ස්කාරයා විසින් තැබිය යුතුයි.

එවොයිර්ඩුපොයි: අවුන්ස් ¼, අවුන්ස් ½, අවුන්ස් 1, අවුන්ස් 2, අවුන්ස් 4, අවුන්ස් 8, රාත්තල් 1, රාත්තල් 2, රාත්තල් 4, රාත්තල් 7.

22. ලයිසන්ස්කාරයා තමාගේ පොත්පත් තැබීම පිණිස මින්පසු සඳහන්කරන ගුරුකම් පිළිපැදිය යුතුයි.

---

## අබිං බෙදා විකුණන අයගේ බඩුගණන් පොතේ ආදර්ශ පිටුව.

| දතම. | | ර. | අවු. | ඩ්‍රෑ. | ලැබුණේ කාගෙන්ද | වැඩිමනත් කාරණ. |
|---|---|---|---|---|---|---|
| ජූනි 1.— | අතේ තිබෙන ඉතිරි අබිං ... | 17 | 8 | 4 | | |
| | ලැබුනා ... ... | 10 | 8 | 2 | ... ජුවන්පුල්ලේ නො. 1 නො බෙදා විකුණන්නා | |
| | මුළුගණන ... | 28 | 0 | 6 | | |
| | පිටදුන්නා ... ... | 1 | 7 | 9 | | |
| | අවසාන ඉතුරු ගණන ... | 26 | 8 | 13 | | |
| ජූනි 2.— | ලැබුනා ... ... | නැහැ. | | | | |
| | මුළුගණන ... | 26 | 8 | 13 | | |
| | පිටදුන්නා ... ... | 0 | 15 | 5 | | |
| | අවසාන ඉතුරු ගණන ... | 25 | 9 | 8 | | |
| ජූනි 3.— | ලැබුනා ... ... | නැහැ. | | | | |
| | මුළුගණන ... | 25 | 9 | 8 | | |
| | පිටදුන්නා ... ... | 2 | 7 | 1 | | |

## බඩුගණන් පොත තැබීමට ගුරුකම්.

සිහිකටයුත්තක්.—ඉංග්‍රිසියෙන්ද ස්වභාෂා දෙකෙන්ද මේ ගුරුකම්වල කොපි දෙකක් බඩුගණන් පොතේ එක එක කවරේ ඇතුල්පැත්තේ ප්‍රවේසම්ලෙස ඇලවිය යුතුයි.

මේ පොත තැබියයුත්තේ එවොයිර්ඩුපොයි බර ක්‍රමයටයි.

එවොයිර්ඩුපොයි බර.

| | | | |
|---|---|---|---|
| ඩ්‍රෑම්ස් | 16 = | අවුන්ස් | 1 |
| අවුන්ස් | 16 = | රාත්තල් | 1 |
| රාත්තල් | 28 = | ක්වාටර් | 1 |
| ක්වාටර් | 4 = | හොණ්ඩර | 1 |
| හොණ්ඩර | 20 = | ටොන් | 1 |

සැලකියයුත්තක්.—ග්‍රෙන්ස් 180ක් එවොයිර්ඩුපොයි ඩ්‍රෑම්ස් 6·582 —එනම් ඩ්‍රෑම්ස් 7ට අඩුයි.

[Tender for License to sell Opium by Retail within the Local Board limits of Negombo.]

වර්ෂ 1903නේ 14වෙනි රෙගුලාසියේද, 1899යේ 5වෙනි රෙගුලාසියේද ප්‍රකාර මෙහි පහත සඳහන්වෙන ස්ථානේ වර්ෂ 1910යේ අවුරුද්දේ පළමුවෙනි මාස හය තුළ අබිං බෙදා විකිණීම පිණිස බලකඩදසි මිලටගැනීම පිණිස දෙන ටැන්ඩර්ස් (ඉල්ලුම්පත්‍ර) බස්නාහිර පලාතේ ආණ්ඩුවේ වංශාධිපති ඒජන්තතුමා විසින් වර්ෂ 1909ක්වූ නොවැම්බර් මස 22වෙනි දින දවල් 12 වනතුරු කොළඹ කච්චේරියේදී බාරගනු ලැබේ. එසේම තව මාස 6කට නොහොත් 12ක් මාසයකටද ආණ්ඩුවේ කැමැත්තලෙස අලුත්වැඩියාකෙරීමේ නිදහස ආණ්ඩුවට තබාගනය.

බලකඩදසි මිලේටගැනීම පිණිස අදහස්කරන්නාවූ අයවලුන් විසින්

(a) 1910යේ අන්තිම මාස 6ටද | (b) 1911යේ පළමුවෙනි මාස 6ටද

ඒ පිණිස ගෙවීමට සූදානම්වූ ගණන් තමන්ගේ ඉල්ලීම්පත්‍රවල සඳහන්කළ යුතුයි.

2. වර්ෂ 1909ක්වූ නොවැම්බර් මස 22වෙනි දින දවල් 12ට කොළඹ කච්චේරියට තමාම හෝ ලියවිල්ලකින් බලයදෙනලද තමාගේ කළමනාකාරයා හෝ පැමිණ ලයිසන්ස් ලබන පිණිස තමා ඔප්පුකර සිටින මුදල් ගණනෙන් තුනෙන් පංගුවක් වහාම බඳින්ට සූදානම්ව සිටියොත් මිස නැත්නම් කිසිම ටැන්ඩර්පත්‍රයක් කල්පනාවට ගනු නොලැබේ.

3. ටැන්ඩර්පත්‍ර දෙකක නොහොත් වැඩි ගණනක මුදල් ගණන එක සමානවීනම් බද්ද එකී ඉල්ලුම්කාරයන් අතරේ වෙන්දේසියේ දමා එවලේම විකිණීමට හෝ අලුතුවෙන් ටැන්ඩර් ඉල්ලන්ට හෝ, 1899යේ 5වෙනි ආඥාපණතේද 1903නේ 14වෙනි ආඥාපණතේද කියා තිබෙන ප්‍රකාර වෙන ආකාරයකින් තීන්දුකිරීම හෝ බස්නාහිර පලාතේ වංශාධිපති ආණ්ඩුවේ ඒජන්තතුමාගේ කැමැත්තේ හැටියට කළහැකිය.

4. ටැන්ඩර් දමන අයගේ සම්පූර්ණ නම සහ ඔහුට ලියුම් ලැබෙන ස්ථානය සෑම ටැන්ඩර්පත්‍රවලම සඳහන් විය යුතුයි.

5. ඉතා ඉහළ ටැන්ඩරය හෝ කොයියම් ටැන්ඩරයක් හෝ භාරගැනීමට බස්නාහිර පලාතේ ආණ්ඩුවේ වංශාධිපති ඒජන්තතුමා බැඳී නැත.

7. යමෙකුගේ ටැන්ඩරය නොහොත් ඉල්ලීම භාරගතහොත් ඒ අය ලයිසන්ස් ගැනුම්කාරයා වන්නේය. ඔහු එවලේම ඔහුගේ ටැන්ඩරයේ මුදලෙන් තුනෙන් පංගුවක් ගෙවිය යුතුය. තවත් මින්පසු දක්වන කොන්දේසියේ කාරණා ඉෂ්ටකළ යුතුයි.

මීගමුවේ ලෝකල් බෝර්ඩ් මායිම් ඇතුළුව.

---

## බෙදා විකිණීමට ලයිසන්ස් (අවසරපත්‍ර) දීමේ කොන්දේසි.

අබිං විකිණීමට මිලගෙවා ලයිසන්ස් (අවසර) ලබාගන්නා අය විසින් ඔහු ගැනුම්කාරයා බව එකී නිසි බලය ලත් මූලාදෑනිතැන විසින් කියාදුන් වහාම තමා ඉල්ලුම්කළ ගණනෙන් තුනෙන් පංගුවක් මුදලෙන් ගෙවන්ට ඕනෑය. ඒ මුදල ඒ බලයලත් මූලාදෑනිතැන විසින් ඇපයක් වශයෙන් තිබාගන්ට යෙදෙනවා ඇත. ගැනුම් මුදලේ වරින්වර ගෙවන කොටස් වෙනුවට එය තිලව්කරන්ට නුපුළුවන. නුමුත් අන්තිම දෙමාසේට ගෙවන කොටස්වලට එය තිලව්කළ හැකිය. ගැනුම් මුදල මාසේකට හයෙන් පංගුව බැගින් තමාගේ බද්ද පවතින අතරතුර එක එක මාසේ අන්තිම දවසේදී ගෙවියයුතුයි. පළමුවෙනි වාරේ කොටස වර්ෂ 1910ක්වූ ජනවාරි මාසේ 31වෙනි දින ගෙවිය යුතුයි. වාර ගෙවිල්ලක් ප්‍රමාදකරන එක එක දවසට අවුරුද්දට සියේට නවය ගණනේ වැටෙන පොලී ගෙවියයුතුයි. ඇප මුදල ගැනුම්කාරයාගේ ඉල්ලීම පිට ඔහු විසින් නියමකරන බැංකියක නිශ්චල මුදලක් කොට දැමිය හැකිය. එය නැතිවිනම් එකී අලාභය ඔහු විසින් දැරියයුතුයි. නියම දවසේදී යම් වාරමුදල් කොටසක් නොගෙවනලද්දේනම්, නිසි බලයලත් මූලාදෑනිතැන විසින් ඒ ලයිසන්ස් නොහොත් එයින් ගතනොවී තිබෙන කාලප්‍රමාණය එයින් වන පාඩුවට ලයිසන්ස්කාරයා යටත්කොට විකිණිය හැකිය.

2. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ස්ටෝරුව නොහොත් ඉඩම මේ ලයිසන්ස් පත්‍රය තුළ සම්පූර්ණයෙන් විස්තර කළ යුතුයි. මේ ලයිසන්ස් (අවසරය) එකී විස්තරකළ ඉඩමට මිස ඉන් මනත් කිසිවකට ඇතුළත් නොවේ.

3. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම වෙනයම් ගොඩනැගිල්ලක් නොහොත් ඉඩමක් සම්බන්ධව ඇතුළතින් යාම්ඊම්වලට අවකාශ ඇතුව තිබියයුතු නොවේ.

4. මෙයින් ලයිසන්ස් දෙනුලබන ගේදොර ශුද්ධපවිත්‍රවද සනීපලැබෙන අන්දමටද තබාගත යුතුයි.

5. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම පරීක්ෂාකරන්ට නිසි බලයක් මූලාදෑනිතැන විසින් ලියවිල්ලක් පිට පත්කරන කෙනෙකුට නොහොත් ඉන්ස්පැක්ටර් තනතුරකට පහත්නොවන යම් පොලිස් මූලාදෑනියෙකුට දොරවල් ඇරලා පෙන්වීම ඒ ගේදොර භාරව සිටින අයගේ යුතුකමක්ය. තවත් තමා ලඟ තිබෙන අබිං ගැනීම හෝ අලෙවි කිරීම සම්බන්ධ පොත්පත් ලියවිලි නොහොත් ගණන් ලේඛන පෙන්වීමටද, විශේෂයෙන් ඕනෑකළොත් පරීක්ෂාකරන වේලාවට තමා ලඟ නොහොත් ගේදොරෙහි තිබෙන සියලුම අබිං ඉන්ස්පැක්ටර්තැන හෝ පොලිස් මූලාදෑනියා ඉදිරිපිටදී කිරා පෙන්වීමට හෝ භාරේ සිටින අය බැඳිසිටින්නේය. ලඟ තිබෙන අබිං ප්‍රමාණයෙත්, පොත්වල හැටියට පරීක්ෂාකරන වේලාවට තිබියයුතු ප්‍රමාණයෙත් වෙනසක් දකින්ට තිබුනිනම් භාරකාරයා විසින් තමන්ට හැකිපමණින් ඊට කාරණා පෙන්විය යුතුයි.

6. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේදී අබිං කන්ට ඉඩදිය යුතුනොවේ.

7. මෙයින් ලයිසන්ස් දෙනලද ඉඩමෙහි තබා තිබෙන අබිං යම් විධියකින් අන් ද්‍රව්‍ය හා සමග මිශ්‍රකිරීමක් හෝ එහි ගතිය නරක්කිරීමක් හෝ නොකළ යුතුයි.

8. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි කෝලාහල ආදි නොනිසි හැසිරීම්වලට ඉඩනොදිය යුතුයි.

9. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේ මත්බීම නොහොත් අබිං පාවිච්චිකරලා මත්ව සිටින යම් අයෙකුට නොහොත් වයස අහලොවෙන් අඩුලෙස පෙනෙන යමෙකුට අබිං දියයුතු නොවේ.

10. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමට රාත්‍රියේ අටටත් උදේ හයටත් අතරේ අබිං භාරගන්ට හෝ එයින් එය පිටකරන්ට හෝ යුතුනොවේ.

11. පිටු ගණන්කර ඉලක්කම් අමා බැඳපු ඔබ්බු ගණන්ගන්නා පොතක් මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි තිබාගත යුතුයි. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමට මෙහි අන්දමේ පොතක් ලයිසන්ස්කාරයා තමාගේ ලයිසන්ස් පත්‍රය ගන්නාවිට නිසි බලයලත් මූලාදෑනිතැන විසින් නොමිලයේ දෙනුලැබේ. අලුත් පොතක් ඕනෑවීනම් ලයිසන්ස්කාරයා විසින් නිසි බලයලත් මූලාදෑනිතැනගෙන් මුදලට ගතයුතුයි. ඒ මූලාදෑනිතැනට පළමුවෙන් දීපු පොත භාරදිය යුතුයි.

12. ලැබුනාවූ සියලුම අබිංවල ගණන්ද, අලෙවිවූ ප්‍රමාණයද ඒ ගනුදෙනුවූ වහාම බඩු ගණන්ගන්නා පොතේ පිළිවෙලින් සටහන්කිරීම ලයිසන්ස්කාරයාගේ යුතුකමක් වන්නේය. පොතේ සියලුම කොටු හරිලෙස පිරවිය යුතුයි. තවත් ලඟ තිබෙන ප්‍රමාණය දවස පටන්ගැන්මේදීත් කෙළවරේදීත් පැහැදිලිලෙස පෙනෙන්ට තිබියයුතුයි.

13. එක එක මාසේ දෙවෙනි දින නොහොත් ඊට මත්තෙන් බඩු ගණන්ගන්නා පොතේ හරි පිටපතක්ද, නොම්මර 20 කොන්දේසියේ ප්‍රකාර තිබාගන්ට ඕනෑකරන පොතේ හරි පිටපතක්ද පොලිසියේ ඉන්ස්පැක්ටර් ජනරාල්තුමා වෙත ඇරවීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

14. පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාට ඒ හරි පිටපත් ලැබුනුවිට ඒ බවට කුවිතන්සියක් ඇරීම එතුමාගේ යුතුකමකි. හරි පිටපතක් ඇරලා සතියක් ඇතුළත ලයිසන්ස්කාරයාහට එවැනි කුවිතන්සියක් නොලැබුනිනම් එකී පිටපත් ලැබුනාද නැද්ද කියා පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාගෙන් විභාගකිරීමද එය නොලැබී තිබුනානම් එසින් පිටපත් ඇරීමද ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

15. තමාගේ ලයිසන්ස් පත්‍රය ලැබෙන්ට ප්‍රථමයෙන්, මෙසින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි වැඩට පත්කරන්ට අදහස්කර සිටින අයවලුන්ගේ නම් සටහන්වන ලැයිස්තුවක් නිසි බලයලත් මූලාදෑනිතැනට ඔප්පුකිරීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි. වැඩට පත්කරනලද එක එක අයගේ සම්පූර්ණ නම සහ විස්තරය එකී ලැයිස්තුවෙහි අඩංගුවිය යුතුයි. තවත් ඒ එක එක අය විසින් කරන්ට යන වැඩේ ස්වභාවද සඳහන්කළ යුතුයි. මේ අයවල් වයස අවුරුදු විසිඑකෙන් වැඩිවූවෝ වියයුතුයි. ඔවුන් හොඳ කල්ක්‍රියාවේ අයවල් බව නිසි බලයලත් මූලාදෑනිතැනට ඒත්තුවීයාම ඕනෑකෙරේ. මේ ලයිසන්ස් පත්‍රයෙහි නිසි බලයලත් මූලාදෑනියා විසින් නම ඒත්තුනොගත් කිසිකෙනෙකුන් ලයිසන්ස්කාරයා වෙනුවට අබිං භාරව සිටින්ට හෝ අබිං භාරගන්ට හෝ විකුණන්ට හෝ පත්කරගත යුතුනොවේ. නම ඒත්තුනොගත් කිසිකෙනෙකුට යටකී කිසි කටයුත්තක් කරන්ට ලයිසන්ස්කාරයා විසින් ඉඩදිය යුතුනොවේ.

16. වැඩට පත්වසිටින අයවලුන්ගේ ලැයිස්තුව අලුත්කරන්ට උවමනාවූ කල්හි ඒ ගැන නිසි බලයලත් මූලාදෑනිතැනගෙන් කලින්කල ඉල්ලුම්කළයුතුයි. ඒ කරන වෙනසක් ඇත්නම් මේ ලයිසන්ස් පත්‍රයෙහි ඒ ඒත්තුගත් බවට සටහන්කළ යුතුයි. තවත් මෙසින් ලයිසන්ස්ලැබූ ඉඩමක වැඩට පත්වසිටින යම් අයෙකු අහක්කරන්ට නිසි බලයලත් මූලාදෑනිතැනගෙන් දැන්වීමක් ලැබුනවිට එය ලැබී සතියක් ඇතුළත ඒ වැඩකාරයාගේ නම ලැයිස්තුවෙන් අහක්කරන පිණිස මේ ලයිසන්ස් කඩදාසිය නිසි බලයලත් මූලාදෑනිතැනවෙත ඔප්පුකළ යුතුයි. ඉන්පසු ඒ අය මෙසින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි වැඩට අයෝග්‍යවන්නේය.

17. මේ ලයිසන්ස් කඩදාසියේ නොම්මරයද, ලයිසන්ස්කාරයාගේ නමද, "අබිං බෙදා විකිණීමට ලයිසන්ස් ලදී" යන වචනද ලෑල්ලක පහසුවෙන් කියවන්ට හැකිලෙස ලියා මෙසින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේ ප්‍රකාශ ස්ථාන යක පිහිටුවා තිබ්බවීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

18. මෙසින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම අබිං සහ සුරුට්ටු විකිණීම පිණිස මිස වෙන වැඩකට හෝ කාරණයකට ගතයුතු නොවේ.

19. අත්පිට ගෙවන මුදලට මිස අබිං විකිණිය යුතුනොවේ.

20. ඩ්‍රෑම්ස් 4කට වැඩි බර ඇති අබිං කොටසක් විකුණනලද කල්හි මිලටගත් අයගේ සම්පූර්ණ නම ගමද විකුණපු ප්‍රමාණයද, විකුණපු දිනද බඩුගණන් පොතේ වැඩිමනත් කාරණා සටහන්කරන්ට තිබෙන කට්ටියෙහි සඳහන්කිරීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

21. හරි තරාදියක්ද, මෙහි පහත දක්වන ප්‍රමාණ පඩිද මෙසින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි නිතරම පාවිච්චියට ගැණීම පිණිස ලයිසන්ස්කාරයා විසින් තැබිය යුතුයි.

එවොයිර්ඩුපොයි: අවුන්ස් $\frac{1}{4}$, අවුන්ස් $\frac{1}{2}$, අවුන්ස් 1, අවුන්ස් 2, අවුන්ස් 4, අවුන්ස් 8, රාත්තල් 1, රාත්තල් 2, රාත්තල්4, රාත්තල් 7.

22. ලයිසන්ස්කාරයා තමාගේ පොත්පත් තැබීම පිණිස මින්පසු සඳහන්කරන ගුරුකම් පිළිපැදිය යුතුයි.

---

### අබිං බෙදා විකුණන අයගේ බඩුගණන් පොතේ ආදර්ශ පිටුව.

| දිනය. | | ර. | අවු. | ඩ්‍රෑ. | ලැබුණේ කාගෙන්ද | වැඩිමනත් කාරණා. |
|---|---|---|---|---|---|---|
| ජූනි 1.—අතේ තිබෙන ඉතිරි අබිං | ... | 17 | 8 | 4 | | |
| ලැබුනා ... | ... | 10 | 8 | 2 | ... ජුවන්පුල්ලේ නො. 1 තො බෙදා විකුණන්නා | |
| මුළුගණන | ... | 28 | 0 | 6 | | |
| පිටදුන්නා ... | ... | 1 | 7 | 9 | | |
| අවසාන ඉතුරු ගණන | ... | 26 | 8 | 13 | | |
| ජූනි 2.—ලැබුනා ... | ... | නැහැ. | | | | |
| මුළුගණන | ... | 26 | 8 | 13 | | |
| පිටදුන්නා ... | ... | 0 | 15 | 5 | | |
| අවසාන ඉතුරු ගණන | ... | 25 | 9 | 8 | | |
| ජූනි 3.—ලැබුනා ... | ... | නැහැ. | | | | |
| මුළුගණන | ... | 25 | 9 | 8 | | |
| පිටදුන්නා ... | ... | 2 | 7 | 1 | | |

### බඩුගණන් පොත තැබීමට ගුරුකම්.

සිහිකටයුත්තක්.—ඉංග්‍රීසියෙන්ද සිංහල භාෂා දෙකෙන්ද මේ ගුරුකම්වල කොපි දෙකක් බඩුගණන් පොතේ එක එක කවරේ ඇතුල්පැත්තේ ප්‍රවේසම්ලෙස ඇලවිය යුතුයි.

මේ පොත තැබියයුත්තේ එවොයිර්ඩුපොයි බර ක්‍රමයටයි.

එවොයිර්ඩුපොයි බර.

| | | | | |
|---|---|---|---|---|
| ඩ්‍රෑම්ස් | 16 | = | අවුන්ස් | 1 |
| අවුන්ස් | 16 | = | රාත්තල් | 1 |
| රාත්තල් | 28 | = | ක්වාටර් | 1 |
| ක්වාටර් | 4 | = | හොන්ඩර | 1 |
| හොන්ඩර | 20 | = | ටොන් | 1 |

**සැලකියයුත්තක්.—ග්‍රේන්ස් 180ක් එවොයිර්ඩුපොයි ඩ්‍රෑම්ස් 6·582—එනම් ඩ්‍රෑම්ස් 7ට අඩුයි.**

## අබිං තබාගැනීමටද නොබෙදූ විකිණීමටද ලයිසන්ස් (අවසරපත්‍ර) දීමේ කොන්දේසි.

1. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ස්ටෝරුව නොහොත් ඉඩම මේ ලයිසන්ස් පත්‍රය තුළ සම්පූර්ණයෙන් විස්තර කළ යුතුයි. මේ ලයිසන්ස් (අවසරය) එහි විස්තරකළ ඉඩමට (ගේදොරට) මිස ඉන්මනත් කිසිවකට ඇතුළත් නොවේ.

2. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම වෙනයම් ගොඩනැගිල්ලක් නොහොත් ඉඩමක් සම්බන්ධව ඇතුළ තින් යාම් ඊම්වලට අවකාශ ඇතුව තිබියයුතු නොවේ.

3. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ගේදොර ශුද්ධ පවිත්‍රවද සනීප ලැබෙන අන්දමටද තබාගත යුතුයි.

4. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම පරීක්ෂාකරන්ට නිසි බලයලත් මුලාදෑනිතැන විසින් ලියවිල්ලක් පිට පත්කරන කෙනෙකුට නොහොත් ඉන්ස්පැක්ටර් තනතුරකට පහත් නොවන යම් පොලිස් මුලාදෑනියෙකුට දොරවල් ඇරලා පෙන්වීම ඒ ගේදොර භාරව සිටින අයගේ යුතුකමක්ය. තවත් තමා ළඟ තිබෙන අබිං ලැබීම හෝ අලෙවි කිරීම සම්බන්ධ පොත්පත්, ලියවිලි නොහොත් ගණන් ලේඛන පෙන්වීමටද, විශෙෂයෙන් ඕනෑකළොත් පරීක්ෂාකරන වේලාවට තමා ළඟ නොහොත් ගේ දොරෙහි තිබෙන සියලුම අබිං ඉන්ස්පැක්ටර්තැන හෝ පොලිස් මුලාදෑනියා ඉදිරි පිටදී කිරා පෙන්වීමටද භාරේ සිටින අය බැඳී සිටින්නේය. ළඟ තිබෙන අබිං ප්‍රමාණයෙත්, පොත්වල හැටියට පරීක්ෂා කරණ වේලාවට තිබියයුතු ප්‍රමාණයෙත් වෙනසක් දකින්ට තිබුණිනම් භාරකාරයා විසින් තමන්ට හැකිපමණින් ඊට කාරණ පෙන්විය යුතුයි.

5. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහිදී අබිං කන්ට ඉඩදිය යුතුනොවේ.

6. මෙයින් ලයිසන්ස් දෙනලද ඉඩමෙහි තබා තිබෙන අබිං යම් විධියකින් අන් ද්‍රව්‍ය හා සමග මිශ්‍රකිරීමක් හෝ එහි ගතිය නරක්කිරීමක් නොකළ යුතුයි.

7. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි කෝලාහල ආදි නොනිසි හැසිරීම්වලට ඉඩ නොදියයුතුයි.

8. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේදී මත්බීම නොහොත් අබිං පාවිච්චිකරලා මත්වසිටින යම් අයෙකුට නොහොත් වයස පහළොහෙන් අඩුලෙස පෙනෙන කෙනෙකුට අබිං දියයුතු නොවේ.

9. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමට රාත්‍රියේ 8ටත් උදය 6ටත් අතරේ අබිං භාරගන්ට හෝ එයින් එය පිටකරන්ට හෝ යුතුනොවේ.

10. පිටු ගණන්කර ඉලක්කම් දමා බැඳපු බඩු ගණන්ගන්නා පොතක් මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි තබාගත යුතුයි. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමට මෙහි අන්දමේ පොතක් ලයිසන්ස්කාරයා තමාගේ ලයිසන්ස් පත්‍රය ගන්නාවිට නිසි බලයලත් මුලාදෑනිතැන විසින් නොමිලයේ දෙනුලැබේ. අලුත් පොතක් ඕනෑවිනම් ලයිසන්ස්කාරයා විසින් නිසි බලයලත් මුලාදෑනිතැනගෙන් මුදලට ගතයුතුයි. ඒ මුලාදෑනිතැනට පළමුවෙන් දීපු පොත භාරදිය යුතුයි.

11. ලැබුනාවූ අබිංවල සියලුම ගණන්ද අලෙවිවූ ප්‍රමාණයද ඒ ගණුදෙනුවූ වහාම බඩු ගණන්ගන්නා පොතේ පිළිවෙලින් සටහන්කිරීම ලයිසන්ස්කාරයාගේ යුතුකමක් වන්නේය. පොතේ සියලුම කට්ටි හරිලෙස පිරවිය යුතුයි; තවත් ළඟ තිබෙන ප්‍රමාණය දවස පටන්ගැන්මේදීත් කෙළවරේදීත් පැහැදිලිලෙස පෙනෙන්ට තිබිය යුතුයි.

12. ඉකුත්වූ මාසයේ එක එක දවසේ පටන්ගැම්මේදී සහ අවසානයේදී ළඟ තිබෙන ඉතුරු ප්‍රමාණයද එක එක දවසේදී ලැබුනාවූද අලෙවිවූනාවූද ප්‍රමාණයත් පෙන්නුම්කර හරි ලුහුඬු ලේඛනයක එක එක මාසයේ දෙවෙනි දින නොහොත් ඊට ප්‍රථමයෙන් පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්තැනට යැවීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

13. ලයිසන්ස් දෙනුලැබූ එක එක ස්ථානයේ පාවිච්චිය පිණිස මේ ලුහුඬු සටහනේ ෆෝර්ම විසිහතරක් නිසි බලයලත් මුලාදෑනිතැන විසින් ලයිසන්ස් පත්‍රය නිකුත්කරනවිට ලයිසන්ස්කාරයාට නොමිලයේ දෙනුලැබේ. ඉන්මනත් ඕනෑකරන ෆෝර්ම නිසි බලයලත් මුලාදෑනිතැනගෙන් මිලේටගන්ට ඕනෑකෙරේ.

14. එක එක ලුහුඬු සටහන ලැබුනවිට ඒ ලැබුන බවට තුවිතාන්සියක් ඇරීම ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාගේ යුතුකමකි. මේ ලුහුඬු සටහන තැපැල්කර සතියක් ඇතුළත එවැනි තුවිතාන්සියක් ලයිසන්ස්කාරයාට නොලැබුනි නම්, ඒ ලුහුඬු සටහන ලැබුනාද නැද්ද කියා පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාගෙන් විභාගකිරීමද එය නොලැබී තිබුනානම් එයින් පිටපතක් ඇරීමද ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

15. තමාගේ ලයිසන්ස් පත්‍රය ලැබෙන්ට ප්‍රථම මෙයින්, ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි වැඩට පත්කරන්ට අදහස්කර සිටින අයවලුන්ගේ නම් සටහන්වන ලැයිස්තුවක් නිසි බලයලත් මුලාදෑනියාට ඔප්පුකිරීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි. වැඩට පත්කරනලද එක එක අයගේ සම්පූර්ණ නම සහ විස්තරය මෙහි ලියවිල්ලෙහි අඩංගුවිය යුතුයි. තවත් ඒ එක එක අය විසින් කරන්ට යන වැඩේ ස්වභාවද සඳහන්කළ යුතුයි. මේ අයවල් වයස අවුරුදු විසිඑකෙන් වැඩිවූවෝ වියයුතුයි. ඔවුන් හොඳ කල්ක්‍රියාවේ අයවල් බව නිසි බලයලත් මුලාදෑනිතැනට ඒත්තුවියාම ඕනෑකෙරේ. මේ ලයිසන්ස් පත්‍රයෙහි නිසි බලයලත් මුලාදෑනියා විසින් නම ඒත්තුනොගත් කිසිකෙනෙකුන් ලයිසන්ස්කාරයා වෙනුවට අබිං භාරව සිටින්ට හෝ අබිං භාරගන්ට හෝ විකුණන්ට හෝ පත්කරගත යුතුනොවේ. නම ඒත්තු නොගත් කිසිකෙනෙකුට යටකී කිසි කටයුත්තක් කරන්ට ලයිසන්ස්කාරයා විසින් ඉඩදිය යුතුනොවේ.

16. වැඩට පත්වසිටින අයවලුන්ගේ ලැයිස්තුව අමුතුකරන්ට උවමනාවූ කල්හි ඒ ගැන නිසි බලයලත් මුලාදෑනිතැනගෙන් කලින්කල ඉල්ලුම්කළ යුතුයි. ඒ කරන වෙනසක් ඇත්නම් ඒ ලයිසන්ස් පත්‍රයේ ඒ ඒත්තුගත් බවට සටහනක් කළයුතුයි. තවත් මෙයින් ලයිසන්ස් ලැබූ ඉඩමක වැඩට පත්ව සිටින යම් අයෙකු අහක්කරන්ට කියා බලයලත් මුලාදෑනිතැනගෙන් දැන්වීමක් ලැබුනවිට එය ලැබී සතියක් ඇතුළත ඒ වැඩකාරයාගේ නම ලැයිස්තුවෙන් අහක්කරන පිණිස මේ ලයිසන්ස්කඩදාසිය (බලකඩදාසිය) නිසි බලයලත් මුලාදෑනිතැන වෙත දැක්විය යුතුයි. ඉන්පසු ඒ අය මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි වැඩට අයොග්‍යවන්නේය.

17. මේ ලයිසන්ස් කඩදාසියේ නොම්මරයද, ලයිසන්ස්කාරයාගේ නමද, "අබිං බෙදූ විකිණීමට ලයිසන්ස් ලදී" යන වචනද ලෑල්ලක පහසුවෙන් කියවන්ට හැකිලෙස ලියා මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේ ප්‍රකාශ ස්ථානයක පිහිටුවා තිබ්බවීම ලයිසන්ස්කාරයාගේ යුතුකමකි.

18. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේ ස්ටෝරුවට පාවිච්චිකරන කොටස අගුලුලා වසා තිබිය යුතුයි පරීක්ෂාකරන මුලාදෑනියාද ලයිසන්ස්කාරයාද මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමේ වැඩට පත්වූ අයෙක්මෙන් ලයිසන්ස් පත්‍රයේ නම ඒත්තුගෙන තිබෙන අයද හැර අන් කිසිවෙකුට ස්ටෝරුවට යාමට ඊමට අවසර නැත.

19. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩම අබිං විකිණීම පිණිස මිස වෙන වැඩකට හෝ කාරණයකට ගතයුතු නොවේ.

20. මෙයින් අවසරදෙනුලැබූ ඉඩමෙහි අබිං නොඇරපූ ගුලි වශයෙන් තැබියයුතුයි. කපාපූ, කඩාපූ, නොහොත් යම් විධියකින් ඇරපූ ගුලි මේ ඉඩම්වලට භාරගත්තවත් එහි තබත්තවත් නුසුදුසුයි. මෙයින් ලයිසන්ස් දෙනුලැබූ ඉඩමෙහි නිතර පාවිච්චියට ගතහැකි හරි තරාදියක්ද, මෙහි පහත දක්වන ප්‍රමාණ එවොයිර්ඩුපොයි බරද ලයිසන්ස්කාරයා විසින් තිබාගතයුතුයි. අවුන්ස් $\frac{1}{4}$, අවුන්ස් $\frac{1}{2}$, අවුන්ස් 2, අවුන්ස් 4, අවුන්ස් 8, රාත්තල් 2, රාත්තල් 4, රාත්තල් 7.

21. ලයිසන්ස්කාරයා විසින් මින්පසු සඳහන්කරන ගුරුකම් තමාගේ පොත් තබාගැනීමේදී පිළිපැදිය යුතුයි.

---

### අබිං තිබාගැනීමටත් නොබෙදූ විකිණීමටත් ලයිසන්ස් ලැබූ අයවල් විසින් එක එක මාසේ දෙවෙනි දින පසුවෙන්ට ප්‍රථමයෙන් පොලිස් ඉන්ස්පැක්ටර් ජනරාල්තුමාට ඇරියයුතු දින ලේඛනයේ ආදර්ශ පෝර්ම.

| දිනම. | | ර. අ. ඩු. |
|---|---|---|
| ජූනි 1.—ලඟ තිබෙන ප්‍රමාණය | ... ... ... | 120 0 0 |
| භාරගත්තා | ... ... ... | 80 0 0 |
| | | 200 0 0 |
| පිටට දුන්නා | ... ... ... | 72 0 0 |
| ජූනි 2.—ලඟ තිබෙන ප්‍රමාණය | ... ... ... | 128 0 0 |
| භාරගත්තා | ... ... ... | — |
| පිටට දුන්නා | ... ... ... | — |
| ජූනි 3.—ලඟ තිබෙන ප්‍රමාණය | ... ... ... | 128 0 0 |

### අබිං තිබාගැනීමට හෝ නොහොත් නොබෙදූ විකිණීමට ලයිසන්ස් දෙනුලැබූ අයවලුන්ගේ බඩු ගණන්පොතේ ආදර්ශ පෝර්මය.

| දින. | ලඟ තිබෙන ප්‍රමාණය. | භාරගත්තා. | | පිටට දුන්නා. | | | ගණන් පියවන විට ඉතිරිව තිබුනා. |
|---|---|---|---|---|---|---|---|
| | | භාරගත් ගණන. | භාරගත්තේ කාගෙන්ද. | පිටට දුන්නේ කාටද. | පිටට දුන් ගණන. | පිටට දුන් මුළුගණන. | |
| | ර. අ. ඩු. | ර. අ. ඩු. | | | ර. අ. ඩු. | ර. අ. ඩු. | ර. අ. ඩු. |
| ජූනි 1 | 120 0 0 | 80 0 0 | නොම්මර 1 දරන ජුවන්පුල්ලේ නමැති නොබෙදූ විකුණන්නාගෙන් | පානදුරේ නොම්මර 1 දරන ස්ථානයේ හෙන්රි පෙරේරා බෙදූ විකුණන්නාට ... | 7 8 0 | | |
| | | | | වැල්ලවත්තේ නොම්මර 3 දරන ස්ථානයේ ඩේවිඩ් සිංඤෝ බෙදූ විකුණන්නාට ... | 14 8 0 | | |
| | | | | හෙට්ටිවීදියේ නොම්මර 2 දරන ස්ථානයේ කදිරවේල් නොබෙදූ විකුණන්නාට ... | 50 0 0 | 72 0 0 | |
| | | | | | — | — | 128 0 |
| ජූනි 2 | 128 0 0 | | | | | | |

### බඩුගණන් පොත තබාගැනීමට ගුරුකම්.

**සිහිවීම පිණිසයි.**—ඉංග්‍රීසියෙන් සහ ස්වදේශික භාෂාවලින්ද මේ ගුරුකම් අඩංගු පිටපත් දෙකක් බඩුගණන් පොතේ පිටකොළේ ඇතුල් දෙපැත්තේ ප්‍රවේසම් සහිතව අලවා තැබිය යුතුයි.

මේ පොත එවොයිර්ඩුපොයි බර ක්‍රමයෙන් තැබිය යුතුයි.

එවොයිර්ඩුපොයි බර.

| | | | | |
|---|---|---|---|---|
| ඩ්‍රැම්ස් | 16 = අවුන්ස් | 1 | කාර්තු | 4 = හොණ්ඩර 1 |
| අවුන්ස් | 16 = රාත්තල් | 1 | හොණ්ඩර | 20 = ටොන් 1 |
| රාත්තල් | 28 = කාර්තු | 1 | | |

එම් 1909ක්වූ නොවැම්බර් මස 10වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ඇල්. ඩබ්ලියු. බූත්,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

[Tender for supplying Calves to Government Vaccine Establishment at Kanatta.]

1. වර්ෂ 1911යේ ජූනි මස 30වෙනි දිනට ඉකුත්වෙන කාලේ තුළ කනත්තේ තිබෙන ආණ්ඩුවේ වස්සන් එන්නත්කරන ස්ථානයට ඕනෑකරණ තරම් එළහරක් වස්සෝ සැපයීමට ටැන්ඩර්ස්වලින් ඉල්ලුම්කළ යුතුයි.

2. සියලුම ටැන්ඩර්ස් කොපි දෙකක් ඇතුව එක කවරයේ දමා මුද්‍රකර ටැන්ඩර් බෝර්ඩ්හි චෙයාර්මැන් (The Chairman of the Tender Board) කොළඹ ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවට (Office of the Controller of Revenue, Colombo) කියා පිට නම ලියා එවිය යුතුයි.

3. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවේ ටැන්ඩර් පෙට්ටියේ දැමිය යුතුයි; නොහොත් තැපෑලෙන් එවිය යුතුයි.

4. මුද්‍රකරපු ටැන්ඩර්ස්වල ඇන්විලොප් එකේ වම් පැත්තේ ඉහළ "ආණ්ඩුවේ වස්සන් එන්නත්කරන ස්ථානයට ඕනෑකරණ තරම් එළහරක් වස්සෝ සැපයීමට ටැන්ඩර්ය" (Tender for supplying Calves to Government Vaccine Establishment) යන වාසගම ලියා 1909ක්වූ නොවැම්බර් මස 20වෙනි දින දවල් 12ට ප්‍රථම ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ (Controller of Revenue) කන්තෝරුවට ලැබිය යුතුයි. ඉස්පිරිතාලයේ නම ඇන්විලොප් එකේ සටහන්කළ යුතුයි.

5. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැනගෙන් ලබාගතහැකි ෆෝර්මකොළවල ඉල්ලුම්කළ යුතුයි. නියම ෆෝර්මකොළවල නැතුව වෙන අන්දමකින් ඉල්ලුම්කළාට භාරනොගන්න බව දතයුතුයි. ටැන්ඩර් කඩදාසියේ වැරැද්දක් හරිගැස්සුවිට ටැන්ඩර්කාරයාගේ පුරුදු අත්සනේ මුලකුරු දෙක තබන්ට ඕනෑය; නැත්නම් ඒ ටැන්ඩරය බාරගනු නොලැබේ.

6. ෆෝර්මකොළ පහත පෙනෙන ලැයිස්තුවේ ප්‍රකාර ඉල්ලුම්කරන්ට ප්‍රථම කච්චේරියක රුපියල් එකසිය පනහක් මුදල් බැඳ කුවිතන්සිය ලබාගෙණ, ඒ කුවිතන්සිය දී ෆෝර්මකොළ ලබාගතයුතුයි. යම් අයෙක් ඉල්ලුම් කළායින් පසු කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිය කිවොත්, එසේ නැතුව ඔහුට ඊට සෑහෙන සහතික ඇපය දෙන්ට බැරිවුනොත්, එම අය විසින් ෆෝර්මකොළ ගන්ට බැඳපු මුදල රජසන්තකවෙනවා ඇත. කොන්ත්‍රාත්තුව සවිවුනායින් පසු ෆෝර්මකොළ ලබාගැනීමට බැඳපු මුදල ඒ ඒ අයවලුන්ට දෙනවා ඇත.

7. බාරගන්ට යෙදුන ටැන්ඩර්කාරයා විසින් පහත පෙනෙන ලැයිස්තුවේ ප්‍රකාරයට මුදලෙන් රුපියල් තුන්සියයක් ඇප තිබා ටැන්ඩරය සමග එවන ඔප්පුව අත්සන්කරන්ට ඕනෑය. ෆෝර්මකොළ ගන්ට බැඳපු මුදල ඇප මුදලේ කොටසක් මෙන් බාරගනුලැබේ.

8. ඉහත සඳහන්කරණලද සියලුම වගන්ති ඉෂ්ටනොකරන්නාවූ ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර පිළි නොගන්න බව දතයුතුයි.

9. යම් ටැන්ඩරයක් නොහොත් සියලුම ටැන්ඩර්ස් අහක්කිරීමට සහ යම් ටැන්ඩරයකින් කොටසක් බාර ගැනීමට ආණ්ඩුව බලය තබාගන්නා බව දතයුතුයි.

10. වැඩිදුර කාරණ ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැනගෙන් දැනගත හැකිය.

වර්ෂ 1909ක්වූ ඔක්තෝම්බර් මස 29වෙනි දින කොළඹ
සිවිල් වෛද්‍යාචාර්යතැනගේ කන්තෝරුවේදීය.

(අත්සන්කළේ), සී. වී. ග්‍රිෆින්,
වැඩබලන ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැන.

---

[Tender for provisioning the Trincomalee Hoshital.]

1. වර්ෂ 1910යේ ජනවාරි මස 1වෙනි දින සිට 1911යේ ජූනි මස 30වෙනි දිනට ඉකුත්වෙන අවුරුදු 1½ර තුළ ත්‍රිකුණාමලේ ඉස්පිරිතාලයට කෑම සැපයීමට ටැන්ඩර්ස්වලින් ඉල්ලුම්කළ යුතුයි.

2. සියලුම ටැන්ඩර්ස් කොපි දෙකක් ඇතුව එක කවරයේ දමා මුද්‍රකර ටැන්ඩර් බෝර්ඩ්හි චෙයාර්මැන් (The Chairman of the Tender Board) කොළඹ ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවට (Office of the Contsoller of Revenue, Colombo) කියා පිට නම ලියා එවිය යුතුයි.

3. ටැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවේ ටැන්ඩර් පෙට්ටියේ දැමියයුතුයි; නොහොත් තැපෑලෙන් එවිය යුතුයි.

4. මුද්‍රකරපු ටැන්ඩර්ස්වල ඇන්විලොප් එකේ වම් පැත්තේ ඉහල "ත්‍රිකුණාමලේ ඉස්පිරිතාලයට කෑමදීමට ටැන්ඩර්ය" (Tender for provisioning the Trincomalee Hospital) යන වාසගම ලියා 1909ක්වූ නොවැම්බ මස 30වෙනි දිනදවල් 12ට ප්‍රථම ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ Controller of Revenue) කන්තෝරුවට ලැබිය යුතුයි. ඉස්පිරිතාලයේ නම ඇන්විලොප් එකේ සටහන්කළ යුතුයි.

5. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැනගෙන් ලබාගතහැකි ෆෝර්මකොළවල ඉල්ලුම්කළ යුතුයි. නියම ෆෝර්ම කොළවල නැතුව වෙන අන්දමකින් ඉල්ලුම්කළාට භාරනොගන්න බව දතයුතුයි ටැන්ඩර් කඩදාසියේ වැරැද්දක් හරිගැස්සුවිට ටැන්ඩර්කාරයාගේ පුරුදු අත්සනේ මුලකුරු දෙක තබන්ට ඕනෑය නැත්නම් ඒ ටැන්ඩරය බාරගනු නොලැබේ.

6. ෆෝර්මකොළ පහත පෙනෙන ලැයිස්තුවේ ප්‍රකාර ඉල්ලුම්කරන්ට ප්‍රථම කච්චේරියක රුපියල් එකසියයක් මුදල් බැඳ කුවිතන්සිය ලබාගෙණ, ඒ කුවිතන්සිය දී ෆෝර්මකොළ ලබාගතයුතුයි. යම් අයෙක් ඉල්ලුම්කළායින් පසු කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිය කිවොත්, එසේ නැතුව ඔහුට ඊට සෑහෙන සහතික ඇපය දෙන්ට බැරිවුනොත්, එම අය විසින් ෆෝර්මකොළ ගන්ට බැඳපු මුදල රජසන්තකවෙනවා ඇත. කොන්ත්‍රාත්තුව සවිවුනායින් පසු ෆෝර්මකොළ ලබාගැනීමට බැඳපු මුදල ඒ ඒ අයවලුන්ට දෙනවා ඇත.

7. ඕනෑකළොත් ඒත්තුගන්ට යෙදුන බඩුවලින් මෝස්තර (samples) දිය යුතුයි.

8. බාරගන්ට යෙදුන ටැන්ඩර්කාරයා විසින් පහත පෙනෙන ලැයිස්තුවේ ප්‍රකාරයට මුදලෙන් රුපියල් දෙසියයක් ඇප තිබා ටැන්ඩරය සමග එවන ඔප්පුව අත්සන්කරන්ට ඕනෑය. ෆෝර්මකොළ ගන්ට බැඳපු මුදල ඇප මුදලේ කොටසක් මෙන් බාරගනුලැබේ.

9. ඉහත සඳහන්කරණලද සියලුම වගන්ති ඉෂ්ටනොකරන්නාවූ ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර පිළි නොගන්න බව දතයුතුයි.

10. යම් ටැන්ඩරයක් නොහොත් සියලුම ටැන්ඩර්ස් අහක්කිරීමට සහ යම් ටැන්ඩරයකින් කොටසක් බාර ගැනීමට ආණ්ඩුව බලය තබාගන්න බව දතයුතුයි.

11. වැඩිදුර කාරණ ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැනගෙන් දැනගත හැකිය.

වර්ෂ 1909ක්වූ නොවැම්බර් මස [illegible]වෙනි දින කොළඹ
සිවිල් වෛද්‍යාචාර්යතැනගේ කන්තෝරුවේදීය.

(අත්සන්කළේ), ඒ. ජේ. චාමර්ස්,
වැඩබලන ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැන වෙනුවට.

[Tender for supplying Milk to Nuwara Eliya and Badulla Hospitals.]

1. වර්ෂ 1910යේ ජනවාරි මස 1වෙනි දින සිට 1911යේ ජූනි මස 30වෙනි දිනට ඉකුත්වෙන අවුරුදු 1½ක කාලේ තුළ නුවරඑළියේ සහ බදුල්ලේ ඉස්පිරිතාලවලට වෙන්වෙන් වශයෙන් කිරි සැපයීමට ටැන්ඩර්ස්වලින් ඉල්ලුම්කළයුතුයි.

2. සියලුම ටැන්ඩර්ස් කොපි දෙකක් ඇතුව එක කවරයේ දමා මුද්‍රකර ටැන්ඩර් බෝර්ඩ්හි චෙයාර්මැන් (The Chairman of the Tender Board) කොළඹ ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවට (Office of the Controller of Revenue, Colombo) කියා පිට නම ලියා එවිය යුතුයි.

3. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ කන්තෝරුවේ ටැන්ඩර් පෙට්ටියේ දැමිය යුතුයි; නොහොත් තැපෑලෙන් එවිය යුතුයි.

4. මුද්‍රකරපු ටැන්ඩර්ස්වල ඇන්විලොප් එකේ වම් පැත්තේ ඉහල “ ඉස්පිරිතාලයට කිරි සැපයීමට ටැන්ඩර්ය ” (Tender for supplying Milk to the———Hospital) යන වාසගම ලියා 1909ක්වූ නොවැම්බර් මස 30වෙනි දින දවල් 12ට ප්‍රථම ආදායමේ කොන්ට්‍රෝලර්තුමාගේ (Controller of Revenue) කන්තෝරුවට ලැබිය යුතුයි. ඉස්පිරිතාලයේ නම ඇන්විලොප්එකේ සටහන්කළ යුතුයි.

5. ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැනගෙන් ලබාගතහැකි ෆෝර්මකොලවල ඉල්ලුම්කළ යුතුයි. නියම ෆෝර්ම කොලවල නැතුව වෙන අන්දමකින් ඉල්ලුම්කළාට භාරනොගන්න බව දතයුතුයි; ටැන්ඩර් කඩදාසියේ වැරැද්දක් හරිගැස්සුවිට ටැන්ඩර්කාරයාගේ පුරුදු අත්සනේ මුලකුරු දෙක තබන්ට ඕනෑය. නැත්නම් ඒ ටැන්ඩරය භාරගනු නොලැබේ.

6. ෆෝර්මකොල පහත පෙනෙන ලැයිස්තුවේ ප්‍රකාර ඉල්ලුම්කරන්ට ප්‍රථම කච්චේරියක මුදල් රුපියල් පනහක් බැඳ කුවිතන්සිය ලබාගෙණ, ඒ කුවිතන්සිය දී ෆෝර්මකොල ලබාගතයුතුයි. යම් අයෙක් ඉල්ලුම්කළායින් පසු කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිය කිවොත්, එසේ නැතුව ඔහුට ඊට සෑහෙන සහතික ඇපය දෙන්ට බැරි වුනොත්, එම අය ඊසින් ෆෝර්මකොල ගන්ට බැඳපු මුදල රජසන්තකවෙනවා ඇත. කොන්ත්‍රාත්තුව සවිවුනායින් පසු ෆෝර්මකොල ලබාගැනීමට බැඳපු මුදල ඒ ඒ අයවලුන්ට දෙනවා ඇත.

7. භාරගන්ට යෙදුන ටැන්ඩර්කාරයා විසින් පහත පෙනෙන ලැයිස්තුවේ ප්‍රකාරයට මුදලෙන් රුපියල් සියයක් ඇප තිබා ටැන්ඩරය සමග එවන ඔප්පුව අත්සන්කරන්ට ඕනෑය. ෆෝර්මකොල ගන්ට බැඳපු මුදල ඇප මුදලේ කොටසක් මෙන් භාරගනුලැබේ.

8. ඉහත සඳහන්කරණලද සියලුම වගන්ති ඉෂ්ටනොකරන්නාවූ ටැන්ඩර්ස් නොහොත් ඉල්ලුම්පත්‍ර පිළි නොගන්න බව දතයුතුයි.

9. යම් ටැන්ඩරයක් නොහොත් සියලුම ටැන්ඩර්ස් අහක්කිරීමට සහ යම් ටැන්ඩරයකින් කොටසක් භාර ගැනීමට ආණ්ඩුව බලය තබාගන්න බව දතයුතුයි.

10. වැඩිදුර කාරණ ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැනගෙන් දැනගත හැකිය.

වර්ෂ 1909ක්වූ ඔක්තෝබර් මස 29වෙනි දින කොළඹ
සිවිල් වෛද්‍යාචාර්යතැනගේ කන්තෝරුවේදීය.

(අත්සන්කළේ), සී. වී ග්‍රිෆින්,
වැඩබලන ප්‍රධාන සිවිල් වෛද්‍යාචාර්යතැන.

---

[Re-sale of Toll Rents, Colombo District.]

මෙහි පහත සඳහන්වෙන කාලවල්වලට බස්නාහිර දිසාවේ මෙහි පහත සඳහන්වෙන කොයියම් පාලම් රේන්දයක් නමුත් පළමු ගැනුම්කාරයින් විසින් වර්ෂ 1909ක්වූ ඔක්තෝම්බ්‍ර මාසේ මාස් මුදල හෝ එයින් හිඟහිටපු යම් කොටසක් වර්ෂ 1909ක්වූ නොවැම්බ්‍ර මස 29වෙනි දිනදී නොහොත් ඊට ප්‍රථම දිනකදී නොගෙව්වොත් ඔවුන්ගේ අලාබේට වෙනුව එකී රේන්ද වර්ෂ 1909ක්වූ නොවැම්බ්‍ර මස 29වෙනි සඳුදා පස්වරු 2ට කොළඹ කච්චේරියේදී නැවත විකුණන බව මෙයින් දන්වනුය.

නැවත විකිනීමේදී ගැනුම්කාරයින් විසින් ගත් මුදලෙන් දහයෙන් කොටසක් විකිනීමේ දවසේදී මෙහි තබන්නට ඕනෑය.

නැවත විකිනීමේදී යම්කිසි රේන්දයක් විකුණන්ට බැරිවුනොත්, වර්ෂ 1905යේ නොම්මර 21වෙනි ආඥාපණතේ ප්‍රකාරයට පළමු ගැනුම්කාරයින්ට විරුද්ධව ක්‍රියා කරණු ලැබේ.

වර්ෂ 1909ක්වූ දෙසැම්බ්‍ර මස 1වෙනි දින පටන් 31වෙනි දින දක්වා:—

දඹුගමද, කොස්පැලන්කිස්සද, බම්බලපිටියද, ගිරිඋල්ලේ සහ තෝප්පුවේ පාලම් රේන්දද, මීගමුවද, හැඳල සහ කළුතර ඇලරේන්දද, කිතුල්ගහවත්ත තොටුපල් රේන්දයද.

පස්යාලේ සිට හන්වැල්ලටද, පෝරේ සිට බෝපේටද, පස්යාල සිට ගිරිඋල්ලටද, කොළඹ සිට ගාල්ලට යන පාරේ හැතැප්ම 29යේ සහ 30 කනු අතරේද, කොළඹ සිට මහනුවරට යන පාරේ හැතැප්ම 10 සිට 12 සහ 21 සිට 23නේ කනු අතරේද, කොටදෙනියාව සිට මීරිගමටද, පානදුරේ සිට තම්බාපානටද, දිගරොල්ල සහ විසිදුගම සිට වැවිටට යන පාරේ රේන්දද.

ඇල්. ඩබ්ලියු. බූත්,
ආණ්ඩුවේ ඒජන්තවම්හ.

වර්ෂ 1909ක්වූ නොවැම්බ්‍ර මස 10වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

[Tender for Scavenging and Latrine Conservancy, Local Board, Hatton-Dikoya.]

“ වර්ෂ 1910යේ අවුරුද්දට හැටන් දික්ඔය නගර තුළ කුණුකසල සහ කක්කුස්සි ශුද්ධකිරීමේ ටැන්ඩර් පත්‍රය” යි ලියුම්කවරයේ පිටත සඳහන්කරපු මුද්‍රකරනලද ඉල්ලුම් පත්‍ර වර්ෂ 1909ක්වූ නොවැම්බ්‍ර මස 30වෙනි අඟහරුවාදා දවල් 12 වනතුරු හැටන් ලෝකල්බෝර්ඩ් කන්තෝරුවේදී භාරගන්ට යෙදෙනවා ඇත.

විස්තර කරුණු වෙන්වශයෙන් පහත දක්වනලෙස සඳහන්කළ යුතුය.

(1) වීදිවල එකතුවෙන කුණුකසල, ගෙවල් අතුගා එකතුකරන කුණුකසල ආදිය ඉවත්කිරීමද, කාණු ශුද්ධපවිත්‍රකිරීමද.

(2) කක්කුස්සි ශුද්ධකිරීම සහ කසල ඉවත්කිරීමද යනුය.

කොන්ත්‍රාත්තුවේ කටයුතු නිසියාකාර ඉෂ්ටකිරීම පිණිස ඇප තැබීම ඕනෑකරනු ලැබේ.

සියලුම ඉල්ලුම්පත්‍ර හෝ විශෙෂ වශයෙන් එක ඉල්ලුම් පත්‍රයක් හෝ ප්‍රශ්නයක් නොමැතිව ප්‍රතික්ෂෙපකිරීමේ සහ යම් ඉල්ලුම්පත්‍රයක කොටසක් පමණක් පිළිගැනීමේ බලය ලෝකල්බෝර්ඩ් සභාවට තබාගනු ලැබේ.

අණප්‍රකාර,

ජේ. සී. මැකාති ශේසර්,
ලෝකල්බෝර්ඩ් සභාවේ ලේකම්තැන.

වර්ෂ 1909ක්වූ ඔක්තෝම්බ්‍ර මස 31වෙනි දින
හැටන් ලෝකල්බෝර්ඩ් කන්තෝරුවේදීය.

[Closing of roads to Cattle Traffic owing to Rinderpest, Hambantota District.]

ගව වසංගතය පවතින නිසා මොනම ගවයෙක් හෝ ගවයින් බැඳපු කිසිම කරත්තයක් එක ඉල්මහ කච්චි මංගල්‍යයට කතරගමට ගෙනයන්ට නොදෙන බව සහ මෙහි පහත පේන පාරවල්, 1891කේ නොම්මර 9යේ ආඥාපණතේ 12වෙනි වගන්තියේ ප්‍රකාර ගවයින් ගෙන යාම නැවත දැනුම්දෙනතුරු තහනම්කළ බවද මෙයින් දන්වමි.

1. කුමන සිට යාලට යන පාර.
2. තිස්ස සිට කතරගමට යන පාර.
3. කටගමුවේ සිට කතරගමට යන පාර.

ඈල්. ඈස්. වුල්ෆ්,
උපඒජන්ත වමහ.

වර්ෂ 1909ක්වූ නොවැම්බ මස 4වෙනි
දින හම්බන්තොට කච්චේරීයේදීය.

---

[Election of Unofficial Members, P. R. C., Kurunegala.]

වර්ෂ 1861කේ දහවෙනි ඉලක්කමේ ආඥාපණතේ විසි හයවෙනි වගන්තියේ ප්‍රකාර කුරුනෑගල දිස්ත්‍රික් කොමිටියට වර්ෂ 1910, 1911 සහ 1912 අවුරුදුවලට එරෝපාකාර බර්ගර් සහ ස්වදේශක්කාර සභාකාර තනතුරට පැමිණීමට කැමතිව සිටින අය තමුන් එසේ කල්පනාකර තිබෙන බව තෝරාගැනීමේ අවසට දසදවසක් ප්‍රථමයෙන් වයඹ දිසාවේ ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේ ප්‍රධාන තැනට ලියවිල්ලකින් දැනුම්දෙන්නට ඕනෑබව මෙයින් දන්වනවාය. වර්ෂ 1909ක්වූ දෙසැම්බර් මස 13වෙනි සඳුදා පස්වරු 10ට කුරුනෑගල කච්චේරියේදී තෝරාගන්ට යෙදෙනවා ඇත.

ටී. ජේ. විලව්,
සෙක්‍රතාරිස් වමහ.

වර්ෂ 1909ක්වූ නොවැම්බර් මස 1වෙනි දින
කුරුනෑගල ප්‍රොවින්ෂල් රෝඩ් කොමිටියේදීය.

---

[Election of Unofficial Members, P. R. C., Kegalla.]

වර්ෂ 1861කේ දහවෙනි ඉලක්කමේ ආඥාපණතේ විසි හයවෙනි වගන්තියේ ප්‍රකාර කෑගල්ල දිසාවේ රෝඩ් කොමිටියට වර්ෂ 1910, 1911 සහ 1912ත් ඒරෝපාකාර බර්ගර් සහ ස්වදේශක්කාර සභාකාර තනතුරට පැමිණීමට කැමතිව සිටින අය තමුන් එසේ කල්පනාකර තිබෙන බව තෝරාගැනීමේ දවසට දසදවසක් ප්‍රථමයෙන් සබරගමුව පලාතේ රෝඩ් කොමිටියේ ප්‍රධානතැනට ලියවිල්ලකින් දැනුම්දෙන්නට ඕනෑ බව මෙයින් දන්වනවාය.

වර්ෂ 1909ක්වූ දෙසැම්බර් මස 4වෙනි දිනදී කෑගල්ලේ කච්චේරියේදී පස්වරු 10ට තෝරාගන්ට යෙදෙනවා ඇත.

ජේ. සී. ඩබ්ලිව්. රොක්,
සෙක්‍රතාරිස් වමහ.

වර්ෂ 1909ක්වූ නොවැම්බර් මස 2වෙනි දින
සබරගමු පලාතේ රෝඩ් කොමිටියේදීය.

---

[Election of Unofficial Members, P R C., Ratnapura.]

වර්ෂ 1861කේ දහවෙනි ඉලක්කමේ ආඥාපණතේ විසි හයවෙනි වගන්තියේ ප්‍රකාර රත්නපුරේ දිසාවේ රෝඩ් කොමිටියට වර්ෂ 1910, 1911 සහ 1912ත් එරෝපාකාර බර්ගර් සහ ස්වදේශක්කාර සභාකාර තනතුරට පැමිණීමට කැමතිව සිටින අය තමුන් එසේ කල්පනාකර තිබෙන බව තෝරාගැනීමේ අවසට දසදවසක් ප්‍රථමයෙන් සබරගමුව පලාතේ රෝඩ්කොමිටියේ ප්‍රධානතැනට ලියවිල්ලකින් දැනුම්දෙන්නට ඕනෑ බව මෙයින් දන්වනවාය.

වර්ෂ 1909යේ දෙසැම්බර් මස 4වෙනි දිනදී රත්නපුරේ කච්චේරියේදී පස්වරු 10ට තෝරාගන්ට යෙදෙනවා ඇත.

ජේ. සී. ඩබ්ලිව්. රොක්,
සෙක්‍රතාරිස් වමහ.

වර්ෂ 1909ක්වූ නොවැම්බර් මස 2වෙනි දින
සබරගමු පලාතේ රෝඩ් කොමිටියේදීය.

---

[Election of Unofficial Members, Local Board, Jaffna.]

ජපනේ ලෝකල් බෝර්ඩ් හෙවත් සනීප ආරක්ෂාකිරීමේ සහ නගරය දියුණුකිරීමේ සභාවට නිල නොදරන සාමාජිකවරු තුන්දෙනෙක් තෝරාගැනීම පිණිස වර්ෂ 1898වේ නොම්මර 13 දරන ලෝකල් බෝර්ඩ් හෙවත් සනීප ආරක්ෂා පිළිබඳ ආඥාපණතේ රෙගුලාසි ප්‍රකාර සම්මුතියක් වර්ෂ 1909ක්වූ දෙසැම්බර් මස 4වෙනි දින සෙනසුරාදා පෙරවරු 11 කන්සමට ජපනේ කච්චේරියේදී පවත්වන්ට මම අදහස්කර තිබෙන බව මෙයින් ප්‍රසිද්ධලෙස දැනුම්දෙන්ට යෙදේ.

ඈෆ්. එච්. ප්‍රයිස්,
උතුරු පලාතේ ඒජන්තතැන වමහ.

වර්ෂ 1909ක්වූ නොවැම්බර් මස 4වෙනි
දින ජපනේ කච්චේරියේදීය.

---

[Supreme Court Criminal Sessions, Kandy.]

ශ්‍රී ලංකාවීපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම්, මධ්‍යම දිසාවේ ක්‍රිමිනෙල් නඩුවිභාග වාරය වර්ෂ 1909ක්වූ දෙසැම්බර් මස 1වෙනි දින පෙරවරු 11 පැය පටන් මහනුවර තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත. එකී යම් කාරණ ඇතුව සිටින සෑමදෙනාම යටකී ස්ථානයට යටකී වෙලාවට ඇවිත් පෙණිසිටින්ට ඕනෑවත්ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සෑමදෙනාටම දන්වන්නෙමි.

ජේ. ඈස්. ද සේරම්,
උ. මැ. ප. පිස්කල් වෙනුවට.

වර්ෂ 1909ක්වූ නොවැම්බර් මස 3වෙනි දින
අනුරාධපුර පිස්කල් කන්තෝරුවේදීය.

---

## UNOFFICIAL ANNOUNCEMENTS.

### අ නා දැ න් වී ම.

[R. A. De Silva.]

කොළඹ දෙමටගොඩ වීදියේ අංක 96 දරණ ස්ථානයෙහි දැනට පදිංචි කළුතර දිස්ත්‍රික්කුවේ පානදුර තොටමුනේ වාද්දුබද්දේ කුඩාවාද්දුවේ රණසිංහගේ ඇල්බර්ට් ද සිල්වා වන මා මෙදින සිට මාස තුනක් ගියතැන ගාල්ල දිස්ත්‍රික්කුවේ සිංහල භාෂාවෙන් වැඩ කිරීමට ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකුමෙන් පත්කරණ පිණිස රෙජිස්ට්‍රාර් ජනරාල් උන්නාන්සේගෙන් ඉල්ලන බව වර්ෂ 1907තේ අංක 1කේ ආඥාපණතේ පළමුවෙනි උපලේඛනයේ B අක්ෂරය දරණ කොටසේ දෙවෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

ආර්. ඒ. ද සිල්වා.

වර්ෂ 1909ක්වූ නොවැම්බර් මස
1වෙනි දින කොළඹදීය.

[B. T. Fernando.]

මීගමු දිස්ත්‍රික්කුවේ අලුත්කුරු කෝරළේ දුසියපත්තුවේ බන්ඩාරවත්තේ පදිංචි බෝතලගේ තෝමස් ප්‍රනාන්දු වන මා මෙදින සිට මාස තුණක් ගියතැන බදුල්ල දිස්ත්‍රික්කුවේ සිංහල භාෂාවෙන් වැඩකිරීමට ප්‍රසිඬ නොතාරිස් කෙනෙකු වෙන් පත්කරණු පිණිස රෙජිස්ට්‍රාර් ජනරාල් උන්නාන්සේගෙන් ඉල්ලන බව වර්‍ෂ 1907තේ අංක 1කේ ආඥාපණතේ 1වෙනි උපලේඛණයේ B අක්‍ෂරය දරන කොඩාසයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

බී. ටී. ප්‍රනාන්දු.

වර්‍ෂ 1909ක්වූ ඔක්තෝබර් මස
30 වෙනි දින සිදුවේදීය.

[L. E. Cabral.]

සියනෑකෝරළේ අදිකාරිපත්තුවේ තලවතුහේන්පිට පදිංචි ලොකුලියනගේ එමලියානු කබ්‍රල් වන මා මෙතැන් සිට මාස තුනක් ගියතැන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කුවේ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිඬ නොතාරිස් කෙනෙකුමෙන් පත්කරණු ලබන පිණිස රිජිස්ත්‍රාර් ජනරාල් උන්නාන්සේගෙන් ඉල්ලන්ට අදහස්කරගෙන සිටින බව වර්‍ෂ 1907 අංක 1කේ ආඥාපණතේ 8වෙනි වගන්තියේ පළමුවෙනි උපලේඛනයේ B අක්‍ෂරය දරන කොට්ඨාසයේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

ඇල්. ඊ. කබ්‍රල්.

වර්‍ෂ 1909ක්වූ නොවැම්බර් මස 10
වෙනි දින තලවතුහේන්පිටදීය.

---

H. C. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.